# නිවන් අවබෝධය ගැන අවබෝධයක්

"එදිනෙදා ජිවත්වීමේ කාර්යයන් සඳහා මනස පැවතුණ ද, මනස නැති මනසක් ය යන අවබෝධය නිවන් දැකීමෙහි දී ඇති වෙයි. නිවන් අවබෝධය යනු නැති මනස නැති මනසක් බව නැති මනසින් අවබෝධ කිරමක් යැ යි සිතිය හැකි ය."

කාලය ද මිනිසාගේ නිර්මාණයකි. එනම් කාලය මනසෙහි නිර්මාණයක් වෙයි. අප කලින් ද සඳහන් කර ඇති පරිදි මනස ද මනසෙහි නිර්මාණයකි. මනසෙහි ඇති වන, එනම් මනස විසින් නිර්මාණය කෙරෙන කුඩා ම ධර්ම වෙයි. සිංහල ථෙරවාද බුදු සසුනෙහි චිත්ත, චෛතසික, රූප ලෙස ඒ ධර්ම හැඳින්වෙයි. මෙහි චිත්තයක් යනු මනසට ගත හැකි කුඩා ම කාල පරිච්ඡේදයෙහි වෙනත් ඉන්ද්‍රියක් නොමැතිව නිර්මාණය කෙරෙන ධර්මයක් යැ යි ගත හැකි ය. චෛතසික යනු චිත්ත සමග ඇතිවන ධර්ම වෙයි. රූපයක් යනු මනසට වෙනත් ඉන්ද්‍රියක් සමග එකතු වී ගත හැකි කුඩා ම කාල පරිච්ඡේදයෙහි නිර්මාණය කළ හැකි ධර්මයක් වෙයි. නිවන ද ධර්මයක් ලෙස ගත්ත ද ඒ අනෙක් ධර්මවලින් වෙනස් වෙයි.

එක් එක් මනසට වෙනත් ඉන්ද්‍රියක් ඇතිව හෝ නැතිව හෝ ගත හැකි කුඩා ම කාල පරිච්ඡේද එකිනෙකට සමාන විය යුතු නො වෙයි. මේ කුඩා කාල පරිච්ඡේදවලට චිත්තක්ෂණය හා රූපක්ෂණය යන නම් භාවිත කෙරෙන බැවින් අපිදු ඒ කාල පරිච්ඡේද ඒ අයුරින් ම හඳුන්වමු. මෙයින් කියැවෙන්නේ චිත්තක්ෂණය හා රූපක්ෂණය සත්ත්වයකුගෙන් (නිරක්ෂකයකුගෙන්) සත්ත්වයකුට (නිරක්ෂකයකුට) වෙනස් විය හැකි බව ය. රූපක්ෂණයක් යනු චිත්තක්ෂණ දහ හතක් ය යන දැනුම සිංහල ථෙරවාදීන්ගේ නිර්මාණයක් වෙයි.

අපේ අර්ථදැක්වීම් අනුබද්ධයෙන් ගත් කල ඕනෑ ම සත්ත්වයකුගේ රූපක්ෂණයක් ඒ සත්ත්වයාගේ චිත්ක්ෂණයකට වඩා දීර්ඝ විය යුතු බව පැහැදිලි ය. චිත්තක්ෂණයක් යනු අනෙක් ඉන්ද්‍රිය නැති ව මනසට ගත හැකි කුඩා ම කාල පරිච්ඡේදය යැ යි අපි ගනිමු. එවිට චිත්තයක් යනු ඒ කාල පරිච්ඡේදයෙහි නිර්මාණය කෙරෙන ධර්මයක් වෙයි. චිත්තක්ෂණ කුඩා වත් ම ඇතැම් විට සියුම් ව සිතීමේ හැකියාව වැඩි වන්නේ යැ යි සිතිය හැකි ය. එසේ ම ඉක්මනට සිතීමේ හැකියාව ද ඒ අනුව වර්ධනය වන්නේ යැ යි සිතිය හැකි ය.

යම් පෘථග්ජන සත්ත්වයකුගේ චිත්තක්ෂණය කෙතරම් කුඩා වුවත් ඒ ශූන්‍ය නො වෙයි. ඕනෑ ම පෘථග්ජනයකුට නිර්මාණය කළ හැකි කාල පරිච්ඡේදය නිශ්ශූන්‍ය විය යුතු ය යනුවෙන් අපට ඒ බව සූත්‍රගත කළ හැකි ය. රූපක්ෂයක් යනු චිත්තක්ෂණ දහ හතක් හෝ වෙනත් සංඛ්‍යාවක් හෝ විය යුතු යැ යි කියන්නේ ඇයි දැ යි දැන් වටහාගත හැකි වේ යැ යි සිතමි. රූපක්ෂණයක් ඇතිවන්නේ හෙවත් නිර්මාණය කෙරෙන්නේ මනස තවත් ඉන්ද්‍රියක් සමග එකතු වීමෙන් ය. එවිට මනසට ගත හැකි කුඩා ම කාල පරිච්ඡේදය මනසට පමණක් ගත හැකි කුඩා ම කාල පරිච්ඡේදයට වඩා වැඩි වීම අනිවාර්ය විය යුතු බවට සැකයක් නැත. වෙනත් ඉන්ද්‍රියයක් නැතිව මනස පමණක් කරන නිර්මාණයක දී මනසට අඩු කාල පරිච්ඡේදයක් නිර්මාණය කර ගත හැකි යැ යි කල්පනා කිරම වරදක් නො වෙයි.

නිවන යනු ධර්මයක් වන්නේ මනසට ගත හැකි යන අර්ථයෙන් නො වෙයි. මනසකින් නිවන් අවබෝධ කළ හැකි නො වෙයි. මනසක් ඇත්නම් එතැන මමත්වයක්, මමායනයක්, අහංකාරයක් (මම, මගේ යන හැඟීම) ඇත. එබැවින් සෝපාදිශේෂ වශයෙන් ගත් කල එදිනෙදා ජීවත්වීමේ කාර්යයන් සඳහා මනස පැවතුණ ද, මනස නැති මනසක් ය යන අවබෝධය නිවන් දැකීමෙහි දී ඇති වෙයි. එහෙත් ඒ අවබෝධය මනසින් ලබාගත හැක්කක් නො විය හැකි ය. එයට හේතුව එලෙස (එදිනෙදා ජීවත්වීමේ කටයුතුවලට හැරුණු කොට) මනසක් පැවතුණ හොත්, එහි මමත්වයක් ඇති බැවිනි. නිවන් අවබෝධය යනු නැති මනස, නැති මනසක් බව, නැති මනසින් අවබෝධ කිරමක් යැ යි සිතිය හැකි ය.

නිවන ථෙරවාද සම්ප්‍රදායෙහි පිහිටා ධර්මයක් ලෙස ගන්නේ නම් අපට ඒ සැලකිය හැක්කේ සීමාකාර අවස්ථාවක් ලෙස ය. පුටුවක්, කන්දක් ආදී වශයෙන් යමක් මනසින් (අනෙක් ඉන්ද්‍රිය ඇති ව හෝ නැති ව හෝ) නිර්මාණය කරන අයුරින් අපට නිවන නිර්මාණය කළ හැකි නො වෙයි. නිවන යනුවෙන් යමක්, තැනක් ආදී වශයෙන් නො පවතියි.

© Prof. Nalin De Silva

පවතින්නේ මනසින් නිර්මාණය කරන දෑ බවත් ඒ මනසට සාපේක්ෂ බවත් නිරපේක්ෂ පැවත්මක් පුටුවක්, කන්දක් ආදියට වත් නොමැති බවත් පුන පුනා කිව යුතු වෙයි. පුටුවක් යනුවෙන් දෙයක් නිර්මාණය කිරමට, ගැනීමට, මනසට රූපක්ෂණයකට වඩා කාල පරිච්ඡේදයක් අවශ්‍ය වන්නේ යැ යි සිතමු. රූපක්ෂණය යනු රූපයක් නිර්මාණය කිරමට අවශ්‍ය කුඩා ම කාල පරිච්ඡේදය වෙයි.

චිත්තක්ෂණයක්, රූපක්ෂණයකට වඩා කුඩා යැ යි සිංහල ථෙරවාදී සම්ප්‍රදායෙහි කියැවෙයි. පෘථග්ජනයකුගේ චිත්තක්ෂණයක් නිශ්ශුන්‍ය වන්නේ යැයි ද අපි කීවෙමු. නිවන ධර්මයක් ලෙස ගත හැක්කේ චිත්තක්ෂණය ශුන්‍ය ලෙස ගැනීමෙන් ය. අපට අවශ්‍ය නම් නිවන ශුන්‍ය චිත්තක්ෂණයක දී ගැනෙන්නක් ලෙස සිතිය හැකි ය. පෘථග්ජනයකුගේ චිත්තක්ෂණය ශුන්‍ය නො වන බැවින් පෘථග්ජනයකුට නිවන් අවබෝධ නො වේ යැ යි ඉන් ගම්‍ය වෙයි. අනෙක් අතට ශුන්‍ය චිත්තක්ෂණයක දී ගත හැකි, නිර්මාණය කළ හැකි දෙයක් නො පවතියි. එබැවින් නිවන යනුවෙන් යමක් තැනක් නො පවතියි. චිත්තක්ෂණය ශුන්‍ය වන බැවින් එවිට මනසක් යනුවෙන් යමක් පැවතීමක් ගැන ද නො කියැවෙයි.

එහෙත් කලින් ද සඳහන් කර ඇති පරිදි සෝපාදිශේෂ නිවන් අවබෝධයෙහි දී එදිනෙදා ජීවත් වීමෙහි කටයුතු සඳහා මනසක් යොදාගැනෙයි. බුදුන්වහන්සේ ද ජීවමානව වැඩ විසූ හතළිස් පස් වසෙහි මනසක් ආධාරයෙන් කරන දෑ කළ සේක. ධර්ම දේශනා කිරම පමණක් නො ව අවශ්‍ය පරිදි පෘථග්ජනයන්ට තේරුම් ගත හැකි පරිදි දැනුම නිර්මාණය කිරම ද ඒ අතර විය. පටිච්චසමුප්පාදය, ආර්යෂ්ටාංගික මාර්ගය ආදිය එවැනි දැනුම් වෙයි.

මෙහි දී අවධාරණය කළ යුතු කරුණක් වනුයේ නිවන් අවබෝධයෙහි දී මනස නැති නො වන බව ය. එසේත් නැත්නම් මනස නැති නො කරන බව ය. මනස නැති කිරම යනු උච්ඡේදවාදී වෙයි. එහි දී ඇති මනසක් නැති කිරම යන අදහස ගෙන දෙයි. එලෙස මනසක් ඇතැ යි ගැනීමත්, ඒ මනස නැති කිරමට හැකි යැ යි ගැනීමත් සිංහල බෞද්ධයන්ට අනුව උච්ඡේදවාදී වෙයි. එබැවින් නිවන් අවබෝධය යනු ඇති මනසක් නැති කිරමක් යන ආකාරයෙන් නො ව නැති මනස නැති මනසක් ලෙස අවබෝධ කිරමක් යන ආකාරයෙන් තේරුම් ගත යුතු ය. නැති මනස එලෙස නැති මනසක් ලෙස මනසින් ගත නොහැකි ය. මනසක් ඇතිව නිවන් අවබෝධ කළ හැකි නො වෙයි. එබැවින් නිවන් අවබෝධ කළ හැක්කේ නැති මනසිනි.

ඉහත සඳහන් වන්නේ නිවන පිළිබඳ නිර්වචනයක් නො වෙයි. බුදුන්වහන්සේ කිසි විටෙකත් නිවන නිර්වචනය නො කළ හ. නිවනට අර්ථ දැක්වීම් නො සැපයූ හ. උන්වහන්සේ නිවන ගැන නිතර ම දෙසූයේ එයත් නො වේ ය, මෙයත් නො වේ ය ආදී වශයෙන් ය. නිවන යනු මේ යැ යි වචනවලින් කිව හැකි නො වෙයි. නිවන සංකල්පයක් නො වෙයි. සිංහල ථෙරවාදී සම්ප්‍රදායෙහි නිවන ධර්මයක් ලෙස ගත්ත ද එසේ ගැනෙන්නේ සංකල්පයක් ලෙස නො වෙයි. චිත්ත ආදී අනෙක් ධර්ම සංකල්ප වුව ද නිවන සංකල්පයක් නො වන ධර්මයක් ලෙස ගත යුතු ය. එමෙන් ම නිවන අනෙක් ධර්ම මෙන් නො ව මනසට සාපේක්ෂව පවත්නා යමක්, ප්‍රදේශයක් ද නො වන බව ද අමතක නො කළ යුතු ය.

මේ සියල්ල පෘථග්ජනයකු නිවන් අවබෝධ කිරම යනු කුමක් දැ යි අවබෝධ කර ගැනීමට කරන ලද තැතක ප්‍රතිඵල වෙයි. මේ කරුණු දැනගත් පමණින් යමකුට නිවන් අවබෝධ නො වෙයි. ඒ කරුණුවලින් ප්‍රකාශ වන්නේ නිවන් අවබෝධ කිරම යනු කුමක් දැ යි අවබෝධ කර ගැනීමකි. එය වුව ද වැරැදි විය හැකි ය. නිවන් අවබෝධ කර ගන්නා තෙක් නිවන් අවබෝධ කිරම යනු කුමක් දැ යි අවබෝධ කර ගත හැකි ද? ඒ කෙසේ වුවත් පෘථග්ජනයෝ අවිද්‍යාව හේතු කොට ගෙන ම දැනුම නිර්මාණය කරති. නිවන් අවබෝධ කිරම යනු කුමක් ද පිළිබඳව ද දැනුම නිර්මාණය කරති.

දැන් අපි නැවතත් පැවැත්ම පිළිබඳ ප්‍රශ්නයට යමු. සිංහල ථෙරවාදී සම්ප්‍රදායෙහි අප නිර්මාණය කරන දැනුමට අනුව නිරපේක්ෂ ලෙස කිසිවක් නො පවතියි. පවත්නා සියල්ල යම් පෘථග්ජන සත්ත්වයකුගේ (නිරක්ෂකයකුගේ) මනසට සාපේක්ෂ ය. ඒ සත්ත්වයාගේ මනස ද ඒ මනසට ම සාපේක්ෂ ය. ඒ ඒ පුද්ගලයා ලෝකය නිර්මාණය කරන්නේ ඒ ඒ පුද්ගලයාට සාපේක්ෂ ව ය. නිවන එලෙස සාපේක්ෂ වශයෙන් හෝ ගත නොහැකි ය. නාගර්ජුනපාදයන් වහන්සේ කළ වරද නිවන සාපේක්ෂ වශයෙන් සසරට විරුද්ධ ව ගැනීම ය. සංකල්පයක් නො වන නිවන සංකල්පයක් වූ සසරෙහි

© Prof. Nalin De Silva

විරුද්ධාර්ථය ලෙස ගත හැකි නො වෙයි. යම් මානයක සංකල්පයක විරුද්ධාර්ථය තවත් සංකල්පයක් ම වෙයි. පෘථග්ජන මනස සංකල්ප නිර්මාණය කරන්නේ ම එලෙස විරුද්ධාර්ථ වශයෙන් වීමට බොහෝ දුරට ඉඩ ඇත.

ඒ ඒ පුද්ගලයා තම ලෝකය නිර්මාණය කරන්නේ තමන්ගේ මනසට ඉන්ද්‍රිය පද්ධතියට හා සංස්කෘතියට සාපේක්ෂව ය. තම තමන්ගේ අත්දැකීම් ඒ ඒ අයට ලැබෙන්නේ ද එවැනි ම වූ සාපේක්ෂතාවකින් ය. බටහිර විද්‍යාව බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි නිර්මාණය කරනු ලැබූවකි. නිව්ටෝනීය ලෝකය ප්‍රධාන වශයෙන් අයිසැක් නිව්ටන් විද්වතා විසින් ද අනෙක් අයගේ දායකත්වයෙන් ද ගොඩනගනු ලැබූ දැනුම් පද්ධතියකි. ක්වොන්ටම් ලෝකය මැක්ස් ප්ලෑන්ස් විද්වතා හා ඉන් පසුව පැමිණි බටහිර විද්‍යාඥයන් කිහිප දෙනෙකු අතින් නිර්මාණය වූ දැනුම් පද්ධතියකි. ඒ එක් දැනුම් පද්ධතියක් වත්, එනම් එක් ලෝකයක්වත්, නිරපේක්ෂ නො වෙයි. ඒ සාපේක්ෂ දැනුම් පද්ධති හෙවත් ලෝක වෙයි.

නිව්ටෝනීය ලෝකය සරල වූවක් විය. එහි වස්තු, විකිරණ ආදිය නිරීක්ෂකයාගෙන් ස්වායත්ත ව පවතියි. ඒ වස්තු ආදියට නිරපේක්ෂ මෙන් ම වාස්තවික පැවැත්මක් ද වෙයි. නිරීක්ෂකයාගෙන් තොර ව අවකාශය පවතියි. එහි කාලය නිරපේක්ෂව ගලා යයි. වස්තු ඇත්තේ ඒ අවකාශයෙහි ය. වස්තුවල පිහිටීම, හැඩරුව ආදිය බාහිර බලපෑම් යටතෙහි වෙනස් වෙයි. ඒ වෙනස්වීමේ රටා හැඳිනගෙන නියම, ප්‍රවාද ආදි වශයෙන් දැනුම නිර්මාණය කිරමක් නිව්ටෝනීය විද්‍යාවෙහි දී සිදුවෙයි. නිව්ටෝනීය විද්‍යාව යනුවෙන් අප මෙහි දී යොදන්නේ බටහිර භෞතික විද්‍යාවෙහි කොටසක් පමණක් හැඳින්වීමට නො වෙයි. බටහිර රසායන විද්‍යාව හා බටහිර ජීව විද්‍යාව මුළුමනින් ම නිව්ටෝනීය විද්‍යා වෙයි. මාක්ස්වාදය ද, බටහිර සමාජීය විද්‍යාවන් ද නිව්ටෝනීය විද්‍යා වෙයි.

බටහිර භෞතික විද්‍යාවෙහි තාප ගතිකය හා ක්වොන්ටම් භෞතිකයත් නිව්ටෝනීය විද්‍යාවන්ගෙන් ඔබ්බට යෑමට උත්සාහ කෙරුණු ක්ෂේත්‍ර වෙයි. එහෙත් එහි ද සීමාකම් පවතියි. අප උත්සාහ කළ යුත්තේ මේ සීමාකම්වලින් කොටු නො වී ලෝකයක් නිර්මාණය කිරමට ය. අයින්ස්ටයිනීය සාපේක්ෂතාවාදය වුව ද අවසාන වශයෙන් ගත් කල නිව්ටෝනීය විද්‍යාවකි. එහි නිව්ටෝනීය සුසමාදර්ශය (පැරඩයිමය) නැත. එහෙත් එහි නිව්ටෝනීය, එනම් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva